
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## නෝංජල් නොවීමේ මහිමය!

**නෝං**ජල් භාවය යන්නට ඉතා සමීපව යන වචන දෙකක් වෙයි. එනම් බයාදුකම සහ නිවටකම යන්නයි. නිවට ඇම්බැට්ටයා (බාබර්) දුටු විට 'මගේ රැවුලත් කපාපන්' යයි එලුවා පවා නිකට පානවා යයි සිංහළ කියමනක් වෙයි. මේ කොයි ආකාරයෙන් සිතා බැලුවත් නෝංජල්කම මනුෂ්‍ය ජීවිතයට නිගා දෙන්නකි. නෝංජල්කම හා තදින් ගෑවුණු භය පක්ෂපාත කම නිසා නෝංජල් පුද්ගලයාට බලවතුන්ගෙන් එන කෙණහිලි, නින්දා, අපහාස එමටය. ඒවාට ප්‍රතික්‍රියා දක්වන්නට හෝ නැගීසිටින්නට ශක්ති යක් ස්වභාවයෙන්ම නෝංජල් පුද්ගලයා තුළ නැත. ඒනිසා ඔහු ඕනෑම පීඩාවක් ඉවසා දරා ගෙන, කරබාගෙන, අනුම් බැණුම් විඳගෙන ඉඳී. එවැනි නෝංජල් ජනතාවගෙන් පිරුණු රටක් වේ නම් ඒ රට නිසැකවම ලෝකයා හමුවේ නිරන්තර අවමාන විඳිනවා මිස කිසිදා ගෞරවයක් නම් නොලබන්නේ ය.

මේ සියල්ල මට සිහිවූයේ අපේ දේශය ශ්‍රී ලංකාව වර්තමානයේ ලෝකයේ බලවත් හා එතරම් බලවත් නොවන රටවල් හමුවේ මුහුණ දී තිබෙන කරදර හා අසන රොස් පරොස් ගැන සිතාබලන විටය. අද මුලු මහත් ලෝකයේම ඇස් යොමුව ඇත්තේ ශ්‍රී ලංකාව වෙතටය. ඒ දෙමළ කොටි ත්‍රස්තවාදීන් සමග වසර 30 කට ආසන්න කාලයක් දහස් ගණනක ජීවිත හා ඉමහත් ධනස්කන්ධයක් බිලිදෙමින් ලංකා රජයයන් පහකට යෙදෙන්නට සිදුවූ දැනට ද සිදුව ඇති කුරිරු යුද්ධයේ අවසානයකට දැන් අප රට එමින් සිටින නිසා ය.

එහෙත් මින් පෙරට වඩා පැහැදිලි වෙන සක් අද අපට පෙනේ. වෙනස අන් කිසිවක් නොව අපේ රටේ නායකත්වය මෑත ඉතිහාස යේ මින් පෙර කිසිදාකට වඩා කොන්ද කෙලින් තබාගෙන නෝංජල් බයාදු නොවී සිංහ ලීලා-වෙන්ම විදේශීන් සමග කතා කරන්නට ඉදිරි-පත්වීමයි. කොටින්ගේ කීම්බස් අසා උන්ගේ මුදල්වලට යටවුණු බටහිර රටවල නියෝජිත යන් ලංකාවේ අභ්‍යන්තර කටයුතු වලට අනිසි ඇඟිලි ගැසීම් කරන්නට යත්න දරනවිට 'ඕයි තමුසෙලාගෙ වැඩක් බලාගෙන පැත්තකට වෙනවා' යයි කියන්නට තරම් කට පණ ඇති නායකත්වයක් අද දවසේ අප රටේ තිබීම සතුටට කාරණයක් නොවේද? අසත්‍ය ප්‍රචාරයන් දහස් ගණනක් ගෙනයද්දී ශ්‍රීලංකා රජය ඉන් වියරු නොවැටී ඉවසිලිවන්තව ඒ එන බොරු ප්‍රචාරයන්ට පිළිතුරුද දෙන අතරම උතුරේ කොටුවී සිටින දෙමළ ජනයාට හෘදයාංගමව පිහිටවන සැටි ද ලොවට පෙන්වීය. ලංකාවට සැබෑ කොන්දක් තිබීම ගැන ඉන්දියාවට ද පුදුමය. එක්සත් ජාතීන්ගේ මණ්ඩලයද ප්‍රසිද්ධියේ කියා සිටියේ ශ්‍රීලංකාව මානව අයිතිවාසිකම් කඩවන විදියේ කිසිවක් කර නැති බවයි. සියල්ලටම වැරදිකරුවන් කොටි සංවිධානය බවද එය ප්‍රකාශ කළා ය. චන්ද්‍රිකාගේ හෝ රනිල්ගේ හෝ රජයක් මේ මොහොතේ ලංකාවේ තිබුණේ නම් නෝර්වේ සහ බටහිර රටවල් ඇවිත් උතරේ කටුකම්බි ගසමින් මායිම් වෙන්-කිරීමේ යෙදෙනවා නිසැකය. 2004 අගදී අප රටට වෙනත් නායකයෙක් පත්ව ආවේ අප කාගේත් වාසනාවට බව දැන් සිතනු මැනවි.

# Who Ordered a Truckload of Dung?

**Ven. Ajahn Brahmavanso Thero - Western Australia**



Imagine you have just had a wonderful afternoon at the beach with a friend. When you return home, you find a huge truckload of dung has been dumped right in front of your door. There are three things to know about this truckload of dung:

**1.** You did not order it. It's not your fault.
**2.** No one saw who dumped it, so you cannot call anyone to take it away.
**3.** It is filthy and offensive, and its stench fills your whole house. It is unbearable.

In this metaphor, the truckload of dung stands for the traumatic experiences that are dumped on us in life. As with the truckload of dung, there are three things to know about tragedy in our life:

**1.** We did not ask for it.
**2.** No one, not even our loved ones can take it away (though they may try).
**3.** It is so awful, and its pain fills our whole life.

There are two ways of responding to this. The first way is to carry the dung around with us. We put some in our pockets, some in our backpacks and briefcases, and some up our shirts. We find when we carry dung around, we lose a lot of friends! Even best friends.

"Carrying around the dung" is a metaphor for sinking into depression, negativity, or anger. We lose a lot of friends, because our friends don't like being around us when we're so depressed. The smell of dung gets worse as it ripens.

Fortunately, there's a second way. We heave a sigh and then get down to work. We fork the dung into a wheel barrow, wheel it around the back of the house, and dig it into the garden. This is tiring, difficult work, but we know there's no other useful option.

Day after day when we dig in the dung, the pile gets a little smaller. Eventually, all that dung in front of our house is gone. Furthermore, a miracle has happened in another part of our house. The flowers in our garden are bursting out in a richness of color all over the place. Their fragrance wafts down the street so that the neighbours, and even passers-by, smile in delight.

"Digging in the dung" is a metaphor for welcoming the tragedies as fertilizer for life. It is work that we have to do alone: noone can help us here. But by digging it into the garden of our heart, day by day, the pile of pain gets less.

It may take us several years, but the morning does come when we see no more pain in our life and, in our heart, a miracle has happened. Flowers of kindness are bursting out all over the place, and the fragrance of love wafts way down our street, to our neighbors, to our relations, and even to passers-by. Then our wisdom tree in the corner is bending down to us, loaded with sweet insights into the nature of life. We share those delicious fruits freely, even with the passers-by, without ever planning to.

Perhaps the moral of this story is that if you want to be service to the world, if you wish to follow the path of compassion, then the next time a tragedy occurs in your life, you may say, **"Ah! More fertilizer for my garden!"**

## මේ ගොම ගොඩ කාගේද?

**එ**ක් දිනක ඔබ මිතුරන් හා සතුටින් කාලය ගත කොට ආපසු පැමිණෙන විට ඔබ නිවස ඉදිරියේ ගොඩගසන ලද විශාල ගොම ගොඩකි. ලොරියකින් ගෙනැවිත් කිසිවෙකු එය දමා ගොස් ඇත කාරණා තුනක් සිතිය යුතුය.

**1.** එය ඔබ ඇණවුම් කළ දෙයක් නොවේ.
**2.** එය එතැන දැම්මේ කවුරුදැයි නොදන්නා නිසා වහාම එය එතැනින් ඉවත්කරන්නයයි කියන්නටද කෙනෙක් නැත.
**3.** එය ජරාවකි. ගෙදර ශෝභාව නසයි. මහා දුගඳ හමන්නකි. මෙහිදී කුමක් කළයුතුද?

මෙම ගොමගොඩ අප වෙතට ආ කරදරයක්, දුෂ්කර අවස්ථාවකට සමාන කළ හැකිය. මෙතැනද කාරණා 3 කි.

**1.** කරදරයට ඔබ ආරාධනා කළා නොවේ.
**2.** අපට ඉතා ඇලුම්කරන කෙනෙකුට හෝ කිසිවෙකුට ඒ කරදර ගත නොහැකිය.
**3.** එය පීඩාකාරීය. ජීවිතය අවුල් කරයි.

මෙහිදී ගතයුතු ක්‍රියා මාර්ග දෙකකි. දෙවිදියකි. එකක් නම් ගොම හැකි පමණ අපේ ඇඳුම්වල, සාක්කුවල, ඉනේ හා හැකි සෑම තැනකම පුරවාගෙන ගොම ගොඩ අවසන් කර දැමීමට උත්සාහ කිරීමයි. එහෙත් එවිට දැඩි දුර්ගන්ධයක් අප වෙතින් හමන්නට පටන් ගනී. අපේ මිතුරෝද නාසය වසාගෙන වහා අපෙන් ඉවත්ව යති. අපේ ජීවිතය ඉතා අප්‍රසන්න අමිහිරි දුක්ඛදායක එකක් වන්නේය.

අප කරදර හිතේ දරාගෙන සිටින විට ඒ කණස්සලු ස්වභාවයට අප ඇසුරු කරන අය කැමති නැත. ඔව්හු අපෙන් ඉවත්ව යති. කරදර අප තුළ පවතින තාක් කල් අපේ ජීවිතද ගෙවී යන්නේ ඉතා කටුක අප්‍රසන්න අයුරිනි.

දෙවන ක්‍රියාමාර්ගය නම් වීල් බැරෝවක් සහ උදැල්ලක් ගෙනැවිත් එයට ගොම පුරවා ගෙන රැගෙන ගොස් අපේ වත්තේ තැන තැන ගස් යට වළලා දැමීමයි. මෙය ඉතා වෙහෙස කාරී වැඩකි. දවසකින් එය ඉවර කරන්නට බැරිවුනත් දිනෙන් දින එසේ කරන විට අවසානයේ ගොම ගොඩ මුලුමනින්ම ගේ ඉදිරියෙන් ඉවත්ව ගොසිනි. මෙහිදී තවත් අපූර්ව දෙයක් සිදුවේ. ටික කලකින්ම වත්තේ ගස් යටට දැමූ ගොම නිසා ඒ ගස්වැල්වල ඉතා මිහිරි සුවඳැති මල් පිපෙන්නටත්, රසැති පළතුරු සැදෙන්නටත් පටන්ගනී. දැන් ඒ ගෙය ඔබට මෙන්ම දකින අයට ප්‍රිය උපදවන මනරම් තැනක් වෙයි.

අපට ආ කරදර ඉවසා ඒවා අපේ ධෛර්‍ය වඩන, අපට පාඩම් කියාදෙන උපදෙස් ලෙස සිතා ඉන් අපේ ජීවිතය පෝෂණය කරගන්නා කල අප සිතේ කරුණාව මෛත්‍රිය වැඩේ. අපේ පෙනුමද ජීවිතයද ප්‍රසන්නවේ. එවිට බොහෝ දෙන නිසැකවම අපට ඇලුම් කරන්නාහ.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

ආදෙයස්‍ය ප්‍රදෙයස්‍ය -කර්තව්‍යස්‍ය කර්මණ:
ක්ෂිප්‍රමක්‍රියමාණස්‍ය - කාල: පිබති තද්‍රසම්

***අර්ථය*** : ගතයුතු දේ ද, දියයුතු දේ ද, කළයුතු ක්‍රියාව ද වහා නොකිරීම නිසා කාලය ඒ රසය බොයි.

**මි**නිස් දහමින් පිරිපුන් මිනිසා මෙම පෘථිවිය මත පවතින ශිෂ්ට මිනිස් සමාජයට සුදුස්සෙකි. මිනිස් දහමින් තොර නම් ඔහු මිනිස් සමාජයට නුසුදුස්සෙකි. මිනිස් සමාජයෙන් ගිලිහීමට හෝ හැකිලීමට ඔහුට සිදුවෙයි.

මෙම පද්‍යයට අනුව පළමුව සඳහන් කොට ඇත්තේ ලබාගත යුතු දේ වහා ලබාගැනීමයි. මේ යටතට බොහෝ කරුණු සම්බන්ධ කළ හැකිය. අධ්‍යාපනය ලබාගත යුතු කාලය තුළ එය නොපමාව ලබාගැනීම, බාහිර විෂයයන් පිළිබඳ දැනුම ලබාගැනීම, සමාජය පිළිබඳ සහ ලෝකය පිළිබඳ අවබෝධය ලබාගැනීම, ආගම දහම පිළිබඳව ලබාගත යුතු දැනුම ලබාගැනීම යනාදී මේවා ඒ ඒ කාලයන් තුළදී වහා ලබාගත යුතු දේවල්ය. ඊට අමතරව මේ සම්බන්ධයෙන් තවත් කරුණක් සඳහන් කළ යුතුය. එනම් සමාජයෙන් හා පරිසරයෙන් හෙවත් සොබා දහමින් ලබාගත යුතු දේවල් පිළිබඳව මිනිසා බොහෝ සෙයින් සැලකිලිමත් විය යුතු බවයි.

මිනිසා ජීවත්විය යුත්තේ සියල්ල ජයගැනීමට පැමිණි අයෙකු ලෙස නොව, බොහෝ දුරට ආගන්තුකයෙකු ලෙසය. ස්වභාව ධර්මය හා සෙසු සත්වයන් කෙරෙහි එක්තරා ආකා රයක සාධාරණ බවක් දැක්විය යුතුය මෙයට නිදසුනක් ලෙස ගවයාගෙන් කිරි ලබාගෙන ඒවා පරිභෝජනය කරනවා වෙනුවට ගවයා මරා ඔහුගේ මස් අනුභව කිරීම යුක්ති සහ ගත නැත. ඒ වගේම මිනිසා දැඩි ආත්මාර්ථකාමීත්වයෙන් යුතුව තමාගේම ප්‍රයෝජනය සඳහා ලෝකයෙන් ලබාගත හැකි සියළු දේ මිරිකා උකහා ගැනීමට උත්සාහ කළයුතු නැත.

මිනිසා විශ්වය තුළ තමන්ට හිමි ස්ථානය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගත යුතුය. වෙනත් ජීවීන් සමග බලන විට මිනිසා විශ්වයේ එක් අංශුවක් පමණි. ඔහු සිය වර්ගයාට මෙන්ම අනෙකුත් ජීවීන්ට හිමි විය යුතු ගෞරවය දැක්වීමට පුරුදු විය යුතුය.

මානසිකව මෙන්ම කායිකවද ඔහු ලෝකය හා සමීපව සබැඳී සිටී. එනිසා ඔහු ලෝකය වෙත දැක්විය යුත්තේ සුරතල් කිරීම නිසා මුරණ්ඩු වූ දරුවෙකුගේ දරදඬු ආකල්පයක් නොව ඉතා නිහතමානී විනීත ආකල්පයකි. මෙම ලෝකය මිනිසාටම නිමවූවක් නොවේ. ලෝක ධර්මයන් තුළ කිසිදු පක්ෂග්‍රාහී බවක් නැත. මිනිසාට ජීවත්වීමට හා පැවතීමට ඉඩ ලැබී ඇත්තේ සෙසු ලෝ වැසි ජීවීන් ඔහුට ජීවත්වීමට ඉඩ දී ඇති නිසාය. මිනිසාගේ පැවැත්ම විශ්වයේ සෙසු ජීවීන් පරිසරය ආදිය මත රඳාපවතින බව අවබෝධකරගත යුතුය.

දෙවැනි කරුණ ලෙස සඳහන් කරන්නේ දිය යුතු දේ නොවලහා දීමයි. තමන් අනුන්ගෙන් ලබාගන්නා සේ තමනුත් තමා ජීවත්වන සමාජයට හා පරිසරයට යමක් දියයුතු බවයි. තමාගෙන් ඉටුවිය යුතු යුතුකම් සියල්ල නොපමාව කළයුතු කරුණකි. තම දෙමා පියන්ට, දූ දරුවන්ට, නෑදෑ හිතවතුන්ට මෙන්ම, සියළුම ජීවීන්ට තමාගෙන් යම්කිසි සේවාවක් ඉටුවිය යුතුය. ඒ වගේම තමා ජීවත්වන පරිසරය, නැතහොත් ස්වභාව ධර්මයටද යම් ප්‍රමාණයක හෝ සාධාරණයක් ඉටුකළ යුතුය. විශේෂයෙන් පරිසරය සුරැකීම ඒ සඳහා කරන හොඳම උපකාරයයි. පරිත්‍යාගශීලීභාවය, උදව් උපකාර කිරීම, සහයෝගීතාව සහ කරුණා මෛත්‍රිය යනාදිය ද අනුන් වෙනුවෙන් කළයුතු යුතුකම් මෙන්ම උතුම් දීමනාවෝ ද වෙති.

තෙවැනි කරුණ ලෙස සඳහන් කරන්නේ කළයුතු කටයුතු කල් නොදමා නොපමාව කළයුතු බවයි. එළඹි කටයුත්ත පසුවට කල්දැමීම අලසයින්ගේ ස්වභාවයයි. බුදුදහමේ සඳහන් ආකාරයට අලසකම යනු පිරිහීමේ දොරටුවයි. අප්‍රමාදීව කටයුතුකරන්නා සියල්ල ජයගන්නෙකි. එසේම තම අරමුණු ඉටුකර ගන්නෙකි. එනිසා අද කළ දේ හෙටට කල් නොදමා අදම නිමකිරීම උදාර ලක්ෂණයකි.



♦ **පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි**
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue**
**London W41UD UK**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**